# පෙරවදන

2010 වර්ෂය සඳහා වන කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරනු ලබන අතර කාර්මික සාමය පවත්වා ගැනීම සඳහා වන ක්‍රියාදාමය තුළ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් පරිපාලන යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට අදාළ කාලසීමාව තුළ විශේෂ අවධානයක් යොමු කරන ලදී. ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය යටතේ පමණක් සිදු කරන ලද ප්‍රගති මෙහෙයුම් කටයුතු ප්‍රදේශීය මට්ටම කරා විමධ්‍යගත කිරීම තුළින් කම්කරු පරීක්ෂණයන්හි ගුණාත්මක බව ඉහළ නැංවීමට හැකියාව ලැබුණි.

වර්ෂය තුළ, වතු ක්ෂේත්‍රයෙහි ඇති වූ වැඩ වර්ජන 9 කටද වෙනත් ආයතන වල ඇති වූ වැඩ වර්ජන 6 කට ද මුහුණ දීමට සිදු වූ අතර, මිනිස් දින 25,071 ක් මෙතුළින් අහිමි විය. කෙසේ වුවත්, රට තුළ ක්‍රමයෙන් අඩුවෙමින් පවතින වැඩ වර්ජන ඇති වීමේ ප්‍රවණතාවය මෙම කාලසීමාව තුළද දැකිය හැකි විය. දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා අංශය මගින් දීප ව්‍යාප්තව ආයතනික මට්ටමින් පවත්වනු ලබන, සමාජ කතිකාවත හා වැඩපොළ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් මගින් හා ඒ තුළින් ප්‍රවර්ධනය වන සාමූහික ගිවිසුම් ඇති කර ගැනීම් මගින් මෙම සාධනීය තත්වය අත් කර ගැනීමට හැකි වී ඇත.

රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා සිදු කළ වැටුප් ඉහළ නැංවීමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා ද වැටුප් ඉහළ නැංවීමක් ලබාදීම වෙනුවෙන් දැනට ක්‍රියාත්මක වන පාඩිපාලක සභා 39 ක රැස්වීම් පවත්වා ඒ අනුව 18% සිට 45% ක් අතර වැටුප් ඉහළ නැංවීමක් සිදු කිරීමට හැකි විය. එමෙන්ම රට තුළ සිදු වන සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලිය තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධව සේවකයන්ගේ වෘත්තිය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳව ඉහළ අවධානයක් යොමු කරවීමටද කටයුතු කරන ලදී.

සමස්තයක් ලෙස බලන කල, GSP + සහනය ලැබීම සම්බන්ධ ගැටලු හා යම් යම් අහිතකර වෙළඳපළ සාධකයන් හමුවේ වුවත්, ආර්ථිකයේ ජීවනාලිය වන ශ්‍රම බලකාය වෙත ඇති විය හැකි අහිතකර බලපෑම් හැකිතාක් දුරකට අවම කිරීම සඳහා දායක වීමට ලැබීම දෙපාර්තමේන්තුවේ සමස්ත නිලධාරීන්ගේ කැපවීමේ ප්‍රතිඵලයකි. මෙම සාර්ථකත්වයන් වෙනුවෙන් මඟපෙන්වීම ලබා දුන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය වෙත ප්‍රණාමය පුද කරනු ලබන අතර, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතායතනයෙන් නිරතුරුව ලබා දෙන දායකත්වය අගය කොට සලකමි.


ඩබ්.ජේ.එල්.යූ. විජයවීර
කම්කරු කොමසාරිස් ජනරාල්

කම්කරු දෙපාර්තමේන්තුව
කම්කරු මහලේකම් කාර්යාලය
කොළඹ 05

# කම්කරු දෙපාර්තමේන්තුව

01

## දැක්ම:

ජාත්‍යන්තර තරඟකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක්

## මෙහෙවර:

කාර්මික සාමය තහවුරු වූ යහපත් වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම

## දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්:

රටේ කාර්මික සාමය පවත්වා ගෙනයාම උදෙසා කාර්මික ආරවුල් සමථ කිරීම හා කම්කරු නීති ක්‍රියාත්මක කිරීම තුළින් කාර්මික ආරවුල් විසදීම.

රටේ කාර්මික සාමය තහවුරු කිරීම උදෙසා සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම හා කම්කරු නීති සම්බන්ධයෙන් සේවක ප්‍රජාව දැනුවත් කිරීම.

කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාළ ශ්‍රම ප්‍රමිතීන් ක්‍රියාවේ යෙදවීම, නව කර්මාන්ත ක්ෂේත්‍රයන් පිළිබඳව සමීක්ෂණ සිදුකිරීම හා ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රමිතීන් සකස් කිරීම.


සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය කිරීම, එහි ප්‍රතිලාභ සාමාජිකයන් වෙත ලබාදීම හා අනුමත පුද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය.

ළමුන්, කාන්තාවන් හා තරුණයන් රැකියාවන් හි නිරත කරවීමේදී ඔවුන්ගේ රැකවරණයට අදාල නීති ක්‍රියාත්මක කිරීම.

කර්මාන්ත ක්ෂේත්‍රයන් හි සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ආරක්ෂාවට අදාලව ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදයන් හඳුන්වා දීම, ඒ පිළිබඳව දැන්වත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය.

# 02


## සංවිධාන සටහන



# කම්කරු පරීක්ෂණ

## 03

සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව 2001 - 2010




මෙරට ක්‍රියාත්මක කම්කරු අණපනත් යටතේ සේව්‍ය - සේවක දෙපාර්ශවය වෙත පැවරී ඇති යුතුකම් හා වගකීම් ඉටුකරවා ගැනීම සඳහා කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය ස්ථාපිත කර ඇත. දෙපාර්තමේන්තුව සතු කලාප කම්කරු කාර්යාල 11 යටතේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39 ක් හා උප කම්කරු කාර්යාල 17ක්ද, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක්ද ක්‍රියාත්මක වන අතර එම කාර්යය සඳහා කම්කරු නිලධාරීන් 430ක් ද, ඉංජිනේරු නිලධාරීන් 25ක්ද ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වල යොදවා ඇත. මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරනු ලබන අණ පනත් වලින් කම්කරු පරීක්ෂණ සඳහා බලය ලැබී ඇති අතර, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්තීන්ට අනුකූලව එම පරීක්ෂණ වල ප්‍රමිතීන් සකස් වී ඇත. ඉහත සංඛ්‍යාලේඛන මගින් පිළිඹිබු වන්නේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මගින් පසුගිය වසර 10 තුළ ක්‍රියාත්මක කරන ලද පරීක්ෂණ පිළිබඳ විස්තරයන්ය. ප්‍රධාන කාර්යාලයේ අංශ මගින් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල මගින් සිදුකරන ලද පරීක්ෂණ පිළිබඳ විස්තර ඉදිරි පරිච්ඡේදයන් මගින් ඉදිරිපත් කර ඇත.


**ජා**ත්‍යන්තර තරඟකාරීත්වය හමුවේ දේශීය නිෂ්පාදන රැක ගනිමින් ජාතික ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස වැඩපොළ සහයෝගීතාවය හා කාර්මික සාමය අත්‍යාවශ්‍ය සාධකයන්ය. විධිමත් කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියක් තුළින් වැඩපොළ අනතුරු අවම කිරීමත්, නියමිත වැටුප් හා සේවා කොන්දේසි ක්‍රියාත්මක කිරීමත්, විශ්‍රාමික දිවිය සඳහා සමාජ සංරක්ෂණය ඇති කිරීමත් මගින් කාර්මික සාමය ස්ථාපිත කළ හැකිය. කාර්මික ආරවුල් හා වැඩවර්ජන නිවාරනය කොට ඵලදායී වැඩපොළක් නිර්මාණය වන්නේ එවිටය.

# 04 කාර්මික සම්බන්ධතා අංශය

කම්කරු දෙපාර්තමේන්තුවෙහි කාර්මික සම්බන්ධතා අංශය කලාප කම්කරු කාර්යාල 11 ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39 ක් හා උප කම්කරු කාර්යාල 17 ක් සමග එක්ව කාර්මික ආරවුල් විසඳීම සිදු කෙරේ. ඒ අනුව 2010 වර්ෂය තුලදී කාර්මික ආරවුල් 3210 ක් වාර්තා වූ අතර වර්ෂය ආරම්භයේ ඉතිරිව පැවති 2430 ක් ඇතුලත්ව මුළු ආරවුල් 5640 කින් සාකච්ඡා සභා වලදී ආරවුල් 2945 ක් විසඳීමට කටයුතු කරන ලදී. එහිදී අයකර ගන්නා ලද මුදල රුපියල් 612,212,660/- කි.

**කාර්මික ආරවුල් විසඳීමේ ප්‍රගතිය 2000 - 2010**

| වර්ෂය | යොමු වූ ආරවුල් | විසඳූ ආරවුල් |
|---|---|---|
| 2000 | 20,635 | 13,096 |
| 2001 | 20,177 | 13,706 |
| 2002 | 18,760 | 14,847 |
| 2003 | 15,947 | 11,981 |
| 2004 | 12,990 | 9,798 |
| 2005 | 11,271 | 8,491 |
| 2006 | 11,273 | 8,853 |
| 2007 | 7,321 | 5,683 |
| 2008 | 7,558 | 5,469 |
| 2009 | 6,724 | 4,294 |
| 2010 | 5,640 | 2,945 |




රට තුළ මනා සේව්‍ය සේවක සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අරමුණු කරගත් මෙම අංශය මගින් පහත සඳහන් පනත් ක්‍රියාත්මක කරනු ලබයි.

1. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත
2. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
3. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ආඥා පනත
4. 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත

මෙම කටයුතු ඉටුකිරීමේදී කාර්මික සබඳතා, සේවය අවසන් කිරීමේ, සමාජ කතිකා හා වැඩපොළ සහයෝගීතා, වෘත්තීය සමිති හා කාර්මික අධිකරණය වශයෙන් උප අංශ 5 ක් යටතේ ක්‍රියාත්මක වේ.

කාර්මික සම්බන්ධතා අංශයට අනුබද්ධ සමාජ කතිකා අංශය මගින් පවත්වනු ලබන සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් වල ප්‍රතිඵල වශයෙන් වාර්තා වන කාර්මික ආරවුල් ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී ඇත. එමෙන්ම ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී කම්කරු කොමසාරිස් ජනරාල් විසින් එක් එක් ක්ෂේත්‍ර හා කම්කරු නිලධාරීන්ගේ ඒ ඒ මාසයේ පරීක්ෂණ මැන බැලීමේ ක්‍රමවේදය කාර්මික ආරවුල් පාලනයට තවත් හේතුවක් වී ඇත.

**සාමුහික ගිවිසුම්**

2010 වර්ෂය තුලදී කාර්මික ආරවුල් පනතේ විධිවිධානයන් යටතේ ලියාපදිංචි කරනු ලැබූ සාමුහික ගිවිසුම් සංඛ්‍යාව 42 ක් වන අතර කලින් වර්ෂයේදී 17 ක් විය.

## වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම

2010 වර්ෂය තුල ලියාපදිංචි වී ඇති වෘත්තීය සමිති සංඛ්‍යාව 107 කි. අවලංගු කිරීම් 109 කි. ඒ අනුව 2010 වර්ෂය අවසානයේ දී පැවති මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2024 කි.

## කාර්මික අධිකරණ කටයුතු

කාර්මික සම්බන්ධතා අංශයට අනුබද්ධ කාර්මික අධිකරණය වෙත අනිවාර්ය බේරුම් කිරීම මඟින් විසඳීම සඳහා 2009 වර්ෂයේ දී ආරවුල් 59 ක් යොමු විය. 2010 වර්ෂයේ එය 29 කි.

## සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම

2010 වසරේදී කාර්මික සම්බන්ධතා අංශය යටතේ ඇති සමාජ කතිකා ඒකකය මඟින් ආයතන මට්ටමින් සිදු කරන ලද වැඩසටහන් ගණන 74 ක් වන අතර ඊට සහභාගී වූ සංඛ්‍යාව 4016 කි. එමෙන්ම ආර්ථික අංශ පදනම් කරගෙන වැඩසටහන් 22 ක් පවත්වා ඇති අතර ඊට 1051 ක සංඛ්‍යාවක් සහභාගී වී ඇත.

## වැඩ වර්ජන

| | වතු | | ආයතන | |
|---|---|---|---|---|
| | 2009 | 2010 | 2009 | 2010 |
| වර්ෂය තුළ ඇති වූ වැඩවර්ජන සංඛ්‍යාව | 02 | 09 | 06 | 06 |
| සහභාගී වූ සේවක සංඛ්‍යාව | 300 | 3185 | 4720 | 1923 |
| අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 300 | 23037 | 7365 | 2034 |

2010 වර්ෂය තුල සිදු වී ඇති වැඩ වර්ජන වලට (පෙරදී මෙන් ) වැටුප් ඉහළ නොදැමීම, " නෝම් " අඩු කිරීම හා වැටුප් නොගෙවීම සම්බන්ධයෙන් සහ වතු හා ආයතනයන්හි අභ්‍යන්තර ආරවුල් ප්‍රධාන හේතු වී ඇත.

1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්.

| | පැමිණිලි | | අයදුම්පත් | |
|---|---|---|---|---|
| | 2009 | 2010 | 2009 | 2010 |
| වර්ෂය ආරම්භයේ නොවිසඳී ඉතිරිය | 114 | 221 | 10 | 12 |
| වර්ෂය තුල දී ලැබුණු ගණන | 185 | 110 | 48 | 27 |
| | 299 | 331 | 58 | 39 |
| වර්ෂය තුල දී විසඳූ ගණන | 78 | 175 | 46 | 25 |
| වර්ෂය අවසානයේ නොවිසඳී ඉතිරිය | 221 | 156 | 12 | 14 |

# 05 ශ්‍රම ප්‍රමිති අංශය

2010 වර්ෂය තුළ ශ්‍රම ප්‍රමිති අංශයේ ක්‍රියාකාරකම් සංක්ෂිප්තව පහත පරිදි වේ.

නිල කාලය ඉකුත් වූ පඩිපාලක සභා 21 කට අදාල නියෝජිතයන් පත් කිරීම සිදු කරන ලදී.

රජයේ ප්‍රතිපත්ති තීරණයක් මත රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා වැටුප් වැඩි වීමක් ප්‍රකාශයට පත්කල අතර ඊට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ද වැටුප් වැඩි කිරීමක් ලබා දෙන ලෙස රජය පෞද්ගලික අංශයෙන් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව අදාළ වැටුප් සංශෝධනය කිරීමේ කටයුතු දැනට ක්‍රියාත්මකව පවතින පඩිපාලක සභා විසින් තීරණය කිරීම සඳහා පඩිපාලක සභා 39ක රැස්වීම් පවත්වන ලදී. ඒ අනුව, විරෝධතා කැඳවීම සහ එම විරෝධතා සලකා බලා ගන්නා ලද අවසාන තීරණ පුවත්පත් වල හා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම මගින් සංශෝධනය කල අවම වැටුප් වැඩිවීම බලාත්මක කරන ලදී. මෙම වැටුප් වැඩිවීම 18% සිට 45% ක අතර පරාසයකින් සිදු කල හැකි වීම පඩිපාලක සභා යාන්ත්‍රණයේ දැකිය හැකි සාර්ථක තත්වයකි.

පවිත්‍රතා සේවා කර්මාන්තයට අදාල සේවා කොන්දේසි තීරණය කර ප්‍රසිද්ධියට පත් කරන ලදී.

තේ හා රබර් වැවීමේ සාමුහික ගිවිසුම දීර්ඝ කිරීම (2010.01.15 දින සිට) සිදු කරන ලදී.

1941 අංක 14 දරණ පඩිපාලක සභා ආඥා පනත, 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත හා 2005 අංක 36 දරණ සේවකයන්ගේ අයවැය දීමනා පනතේ විධිවිධාන වලට අනුව කටයුතු නොකරන සේව්‍යයන් හා ඔවුන්ගේ ව්‍යාපාර ආයතන පිළිබඳ දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කාර්යාල මගින් පරීක්ෂා කරනු ලබන අතර ඒ අනුව සිදු කල මාසික කාලීන පරීක්ෂණ වල ප්‍රගතිය අධීක්ෂණ කරනු ලැබේ. ශ්‍රම ප්‍රමිති අංශය විසින් සියලුම දිස්ත්‍රික් කාර්යාල වලින් ලබා ගන්නා එම තොරතුරු විශ්ලේෂණය කර පිළියෙල කරන වාර්තා ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා වෙනත් අදාල අංශ වෙත සපයා ඇත. 2010 වර්ෂය තුල තෝරාගත් දිස්ත්‍රික් කම්කරු කාර්යාල/ උප කාර්යාල 15ක මාසික පරීක්ෂණ වල ප්‍රගතිය එම කාර්යාල වෙත ගොස් පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් සපයන ලදී.

දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මොණරාගල දිස්ත්‍රික්කය තුල ශ්‍රම ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සම්බන්ධ දැනුවත් කිරීම් වැඩසටහන් 4ක් මොණරාගල, බුත්තල, වැල්ලවාය සහ කතරගම යන නගර වලදී පවත්වන ලදී.

පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයට අදාල පඩිපාලක සභාවේ සේවා නියෝජිතයන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව එම කර්මාන්ත වල සේවක පක්ෂයේ ගැටලු හා වැඩි ප්‍රතිශතයකින් වැටුප් වැඩි කිරීමේදී ඇතිවන බලපෑම පරීක්ෂා කිරීම (ආයතන 4ක් තෝරාගෙන) සිදු කරන ලදී. ඒ අනුව, එම කර්මාන්ත හිමියන් සහ සේවක පාර්ශවයන්ට පිළිගත හැකි ප්‍රමාණයකින් වැටුප් වැඩිකිරීමට හැකිවිය.

**ක**ම්කරු දෙපාර්තමේන්තුවේ ශ්‍රම ප්‍රමිති අංශය මඟින් පෞද්ගලික අංශයේ සේවා නියුක්ත අයගේ රැකියා සුරක්ෂිතභාවය හා සුබ සාධනය කෙරේ බලපාන්නා වූ සේවා තත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්වය ලබාදීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පහත පනත් යටතේ කටයුතු සිදු කරනු ලබයි.

1. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
2. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
3. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත

# නීති ක්‍රියා අංශය

06

2010 වර්ෂය තුළදී නීති ක්‍රියා අංශය මඟින් ගොනු කළ නඩු සංඛ්‍යාව හා අයකර ගැනීමට නියමිත මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| | පනත | නඩු සංඛ්‍යාව | මුදල (රු.) |
|---|---|---|---|
| 01 | පාරිතෝෂික ගෙවීමේ පනත | 2459 | 572,651,283.40 |
| 02 | කාර්මික ආරවුල් පනත | 59 | 8,869,598.30 |
| 03 | සේවය අවසන් කිරීමේ පනත | 39 | 151,607,308.30 |
| 04 | පඩිපාලක සභා ආඥා පනත | 166 | 10,647,282.34 |
| 05 | සාප්පු හා කාර්යාල සේවක පනත | 51 | 3,628,251.00 |
| 06 | කම්කරු විනිශ්චය සභා නියෝග | 134 | 53,903,580.06 |
| 07 | ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 15 | - |
| 08 | සේවක අර්ථසාධක අරමුදල් පනත | 1119 | 259,280,009.00 |


සේවක අර්ථසාධක අරමුදල් නඩු පැවරීම් සංඛ්‍යාව දැනට ලැබී ඇති වාර්තා මත සකසා ඇති බැවින් මෙම සංඛ්‍යාව වෙනස් විය හැකිය.

**කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු අණ පනත් වල ප්‍රතිපාදන දිවයින පුරා ක්‍රියාවේ යෙදවීම නිශ්චිත කිරීම් වස් එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුලින් සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේව්‍ය සේවක සහයෝගීතාව වර්ධනය කිරීම නීති ක්‍රියා අංශයේ මූලික අරමුණය.**

**එම ක්‍රියාවලියේ දී කම්කරු නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නෛතික පියවර ගැනීම නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරීන්ගේ නෛතික ගැටලු වලට උපදෙස් ලබා දීම සහ ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම, මහේස්ත්‍රාත් අධිකරණ වල නඩු මෙහෙයවීම සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ දෙපාර්තමේන්තුවට එරෙහිව ඉහළ අධිකරණ නඩු වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීම නීති ක්‍රියා අංශයේ කාර්යදාමයට අයත් වේ.**

නීති ක්‍රියා අංශය වෙත පසුගිය කාලසීමාව තුළ ක්‍රියා කිරීම සඳහා ලැබුණු නඩු ගොනු අතර පාරිතෝෂික පනත යටතේ ලැබුණු ගොනු සංඛ්‍යාවේ සීඝ්‍ර ඉහළ යාමක් දක්නට ලැබුණි. එම තත්වය පහත රූප සටහනින් විදහා දක්වයි. මෙම තත්වයට බලපෑ ප්‍රධානතම හේතුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් ආරම්භ කරන ලද ගොනු සංඛ්‍යාවේ සීඝ්‍ර ඉහළ යාමයි.

පාරිතෝෂික පනත යටතේ ලැබුණු ගොනු 2004 - 2010



# 07 කාන්තා හා ළමා කටයුතු අංශය

කාන්තා ශ්‍රමිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම්, ආරක්ෂාව සෞඛ්‍ය හා සුබ සාධනය මෙන්ම ළමා ශ්‍රමය මෙරටින් පිටුදැකීමේ අරමුණ සහිතව 2010 වර්ෂය තුළ මෙම අංශය විසින් ඉටුකල ක්‍රියාකාරකම් පහත දැක්වේ.

## කාලීන පරීක්ෂණ

2010 වර්ෂය තුළදී මෙම අංශය විසින් සාප්පු හා කාර්යාල වල, කර්මාන්තශාලා වල හා වැවිලි අංශයේ සේවිකාවන්ගේ සුබ සාධනය, රැකියා සුරක්ෂිතභාවය හා සේවා කොන්දේසි කඩවීම් යනාදී කරුණු පිළිබඳව කාලීන පරීක්ෂණ 180 ක් සිදුකර ඇත. නොකඩවා කාලීන පරීක්ෂණ සිදුකිරීම තුළින් සේවිකාවන්ට මෙම අංශයෙන් ක්‍රියාත්මක කරනු ලබන නීති වල ආරක්ෂාව නිරතුරුව ලැබේ.

## කාන්තා සේවක පොදු පැමිණිලි පරීක්ෂණ

කාන්තා සේවක ගැටලු සම්බන්ධව පැමිණිලි 08 ක් ලැබී ඇති අතර, අදාල දිස්ත්‍රික් කාර්යාල සමඟ ඒකාබද්ධව විමර්ශණයක් කර අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

## ප්‍රසූතිකාධාර පැමිණිලි පරීක්ෂණ

සේවිකාවන්ට හිමි ප්‍රසූතිකාධාර නොගෙවීම් හා අනෙකුත් සේවා කොන්දේසි සැපයීම සම්බන්ධව ලැබී ඇති පැමිණිලි 03 ක් පිළිබඳ දිස්ත්‍රික් කාර්යාල සමඟ ඒකාබද්ධව පරීක්ෂණ සිදුකර ඇත.

## කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්‍රියාවලිය තුල විශේෂ දායකත්වයක් ලබා දෙනු ලබන කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම්, ආරක්ෂාව හා සුබ සාධනය ඇති කිරීම මෙන්ම ළමා ශ්‍රම යෙදවුම වැළැක්වීමේ අරමුණෙන්ද යුතුව මෙම අංශය පහත සඳහන් අණ පනත් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි.

01. 1956 අංක 47 දරන ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත
02. 1934 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත
03. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ ස්ත්‍රීන් හා තරුණ අයට අදාළ කොටස්
04. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ ස්ත්‍රීන් හා තරුණ අයට අදාළ කොටස්

ආයතනයන්හි කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අවසර ලබා දීම සඳහා දිස්ත්‍රික් කාර්යාල සමඟ ඒකාබද්ධ පරීක්ෂණ සිදුකර ඇති අතර රාත්‍රී පරීක්ෂණ 43 ක් සිදුකර ඇත. අවසර ලබාදීම සම්බන්ධ පරීක්ෂණ 216 ක් සිදුකර ඇත.

## ළමා මෙහෙකාර සේවයේ පැමිණිලි පරීක්ෂණ

ළමා හා කාන්තා කාර්යාංශය මගින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින්, විවිධ ආයතන හා පුද්ගලයන් ගෙන් නාමිකව හා නිර්නාමිකව ලැබෙන ළමා සේවක පැමිණිලි විභාග කර බැලීම හා එම සේවා යෝජකයන්ට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි. ඒ අනුව මෙම අංශය වෙත ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් පැමිණිලි 109 ක් ලැබී ඇති අතර පරීක්ෂණ පවත්වා නඩු පැවරීම් 08 ක් සිදුකර ඇත.

## ජාත්‍යන්තර කාන්තා දිනය 2010.03.08

ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් උත්සවය රාජගිරිය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධ්‍යාපන කේන්ද්‍රයේදී පවත්වන ලදී. මේ සඳහා කටුනායක, බියගම, කොග්ගල, අවිස්සාවේල්ල යන ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි කාන්තා සේවිකාවන්ගේ සහජ කුසලතා එළි දක්වමින් ජන කවි ගායනා තරඟාවලියක් පවත්වන ලදී. එහි ජයග්‍රාහිකාවන්ට ත්‍යාග හා කුසලාන සහතික ලබා දෙන ලදී. මෙම උත්සවයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ අඛණ්ඩව වසර 25ක සේවා කාලයක් සපුරන ලද නිලධාරිනියන් 80 දෙනෙකු වෙනුවෙන් සමරු තිළිණ ප්‍රදානය කරන ලදී.

## ළමා ශ්‍රමයට එරෙහි ජාත්‍යන්තර දිනය 2010.06.12

ළමා ශ්‍රමයට එරෙහි ජාත්‍යන්තර දිනය නිමිත්තෙන් කාන්තා හා ළමා කටයුතු අංශය මගින් අත් පත්‍රිකා බෙදාහැරීම හා රූපවාහිනී මාධ්‍ය ඔස්සේ එදින වැදගත්කම අලලා සාකච්ඡා වැඩසටහන් ප්‍රචාරය කරන ලදී. මීට අමතරව දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල 56 කදී දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 56ක් පැවැත්වීම සිදු කරන ලදී.

## විශ්ව ළමා දින සැමරීම 2010.10.01

විශ්ව ළමා දිනය නිමිති කොටගෙන පිළියන්දල කහපොල ශ්‍රී පඤ්ඤානන්ද ජාතික පාසැලේදී පාසැල් සිසුන් 250 දෙනෙකු වෙනුවෙන් විශේෂ සැමරුම් උත්සවයක් ගරු කම්කරු සබඳතා හා ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2010.10.01 දින පවත්වන ලදී. මෙහිදී පාසැල් සිසුන් වෙනුවෙන් පාසැල් පොත්, නිල ඇඳුම් හා පාසැල් බෑගයන් පිරිනමන ලදී. ඒ සඳහා ශ්‍රම වාසනා අරමුදලින් අනුග්‍රහය ලබා දුනි. මෙයට සමගාමීව නැගෙනහිර පළාතේ පාසැල් සිසුන් වෙනුවෙන් 2010.10.01 වෙනි දින ත්‍රිකුණාමලය විවේකානන්ද විදුහලේදී සිසුන් 200 දෙනෙකු වෙනුවෙන් ළමා දින සැමරුම් උත්සවයක් පවත්වන ලදී.

## ළමා ශ්‍රමය වැළැක්වීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ වර්ෂය තුල සමාජ කොටස්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 50ක් හා විශ්ව ළමා දින සැමරුම් උත්සවයට සමගාමීව දිවයින පුරා දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කම්කරු කාර්යාල මගින් පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 56ක් ද පවත්වන ලදී. පරිවාස, කම්කරු හා පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් යාපනය, ත්‍රිකුණාමලය හා මොනරාගල දිස්ත්‍රික්කයන් හී පවත්වන ලදී.

## "ළමා ලංකා" සඟරාව

2010 අප්‍රේල් සහ 2010 ඔක්තෝම්බර් කලාප එළි දක්වීමට කටයුතු කරන ලදී.

## කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන්

මේ යටතේ යටියන්තොට කම්කරු කාර්යාල පරිශ්‍රය තුළ 2010.03.07 දින ද, 2010.10.24 දින වවුනියා දිස්ත්‍රික් කම්කරු කාර්යාල පරිශ්‍රයේදී ද ස්වයං රැකියා වැඩසටහන් පවත්වන ලදී. එමෙන්ම, දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව මොනරාගල කුමාර වත්තේ දී 2010.11.02 දින රබර් කිරි නිෂ්පාදනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනක්ද පවත්වන ලදී.

# 08 විශේෂ විමර්ශන අංශය

2010 වර්ෂය තුළ විශේෂ විමර්ශණ අංශය මගින් සිදු කරන ලද පරීක්‍ෂණ හා පැමිණිලි විභාග කිරීම් වලින් අත්කරගන්නා ලද ප්‍රතිඵල පහත දැක්වේ.

| | |
|---|---|
| ගණනය කරන ලද හිඟ සේ.අ.අ. ප්‍රමාණය (රු.) | 31,498,357.98 |
| ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත මුදල් ප්‍රමාණය (රු.) | 10,798,427.45 |
| ප්‍රතිලාභ ලැබූ සේවක සංඛ්‍යාව | 1522 |

විශේෂ විමර්ෂණ අංශය මගින් 2010 වර්ෂය තුළදී සිදු කරන ලද පරීක්‍ෂණ

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
|---|---|---|---|---|
| හදිසි පරීක්‍ෂණ | 68 | 121 | 259 | 401 |
| ආංශික පරීක්‍ෂණ | 16 | 30 | 45 | 60 |
| සමූහ පරීක්‍ෂණ | 2 | 4 | 6 | 8 |
| මහා පරිමාණ පරීක්‍ෂණ | 15 | 31 | 35 | 39 |

**ශ්‍රී ලංකාව තුල කාර්මික සාමය ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව මෙහි පහතින් දක්වනු ලබන කාර්යභාරයන් ඉටුකිරීම විශේෂ විමර්ශන අංශයේ වගකීම වේ.**

**- සේව්‍ය/සේවක දෙපක්‍ෂය අතර හටගන්නා වූ ජාතික මට්ටමින් හානිදායක විය හැකි බරපතල ආරවුල් විසඳීමෙහිලා මැදිහත්ව කටයුතු කිරීම.**

**- වැසීයාමට ඉඩ ඇති සේව්‍ය ආයතනයන් හඳුනා ගෙන ඒවායේ සේවකයන්ට ව්‍යවස්ථාපිත හිමිකම් අයකර දිම.**

**- සේවක සේවිකාවන්ගේ සුරක්‍ෂිතතාවය හා සෞඛ්‍ය ආරක්‍ෂාව සඳහා කටයුතු කිරීම.**

**- බහුවිධ පරීක්‍ෂණයන් පැවැත්වීම.**

<u>මානව සම්පත් ස්ථාපන සේවා ඒකකය</u>

මෙම අංශය මගින් 2010 වර්ෂයේ දී දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවා නියුක්තිකයන් පිළිබඳ සමීක්‍ෂණයන් සිදු කරන ලදී.

මේ සඳහා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට අනුයුක්ත කර ඇති මානව සම්පත් සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමෙන් අනතුරුව ඔවුන් වෙත ලබා දෙන ලද ප්‍රශ්නාවලි තුළින් දත්ත ලබා ගන්නා ලදී. දත්ත ලබා ගැනීම අවසන් කොට ඇති අතර සමීක්‍ෂණ කාර්යයන් 80% ක් පමණ අවසන් කර ඇත.

# සේවක අර්ථසාධක අරමුදල් අංශය

09


සේවක අර්ථසාධක අරමුදල වෙත 1959 දී දායකත්වය සැපයූ සේවායෝජක සංඛ්‍යාව 6400 ක් හා සේවක සංඛ්‍යාව 850,000 ක් වූ අතර, 2010 වර්ෂය වන විට සක්‍රීය ලෙස දායක වූ සේවා යෝජක සංඛ්‍යාව 62,000 (ඇස්තමේන්තු ගත) ක් හා සක්‍රීය ලෙස දායක වන සේවක සංඛ්‍යාව මිලියන 2.3 (ඇස්තමේන්තු ගත) දක්වා ඉහළ ගොස් තිබේ. එසේම 1959 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික දායක මුදල රුපියල් මිලියන 12 කි. 2010 වර්ෂයේදී දායක මුදල් රැස්කිරීම රුපියල් මිලියන 54,203 කි. ඒ අනුව 2010 අවසන් වන විට අරමුදලේ සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 13.3 (ඇස්තමේන්තු ගත) වන අතර අරමුදලේ ප්‍රමාණය රුපියල් මිලියන 899,650 කි.

2010 වර්ෂය තුළදී මෙම අරමුදල විසින් සිය සාමාජිකයන්ගේ ප්‍රතිලාභ අයදුම්පත් 104,262 වෙනුවෙන් රුපියල් මිලියන 34,896 ක් ප්‍රතිලාභ වශයෙන් අදාල සාමාජිකයාට හෝ නීත්‍යානුකූල ප්‍රතිලාභියාට ගෙවන ලදී.

<u>දායක මුදල් රැස් කිරීම</u>

පසුගිය දශකයක කාලය තුළ පනතේ සංශෝධනය හා පරිපාලන ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය හේතුකොට ගෙන වර්ෂයක් සඳහා දායක මුදල් වර්ධනය වූ ආකාරය පහත දැක්වේ. (1999-2010)

| වර්ෂය | දායක මුදල (රු.මිලියන) |
|---|---|
| 1999 | 13,679 |
| 2000 | 17,009 |
| 2001 | 17,934 |
| 2002 | 19,201 |
| 2003 | 20,348 |
| 2004 | 23,872 |
| 2005 | 24,324 |
| 2006 | 31,720 |
| 2007 | 40,574 |
| 2008 | 45,951 |
| 2009 | 48,712 |
| 2010 | 54,796 |




**1958 ජුනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් අහිමි පෞද්ගලික හා සංස්ථා අංශයේ සේවකයින්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීමට මහඟු අත්වැලක් වීමේ අභිලාෂයෙන් වැදගත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කරන ලදී. මෙම අරමුදලේ පරිපාලනය කම්කරු කොමසාරිස් විසින් ද මූල්‍ය පාලනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ද සිදුකරනු ලබයි.**

සේවක අර්ථසාධක අරමුදල් අංශය

**සේවක අර්ථසාධක අරමුදල් කටයුතු විමධ්‍යගත කිරීම**

වර්ෂය තුළ යාපනය හා පුත්තලම දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා කල්මුනේ කම්කරු කාර්යාල වෙත සේ.අ.අ. කටයුතු විමධ්‍යගත කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ රැසක් ලබා දීම අරමුණු කර ගනිමින් සේවක අර්ථසාධක අරමුදල් පනතට නව සංශෝධන සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු නිමා කරන ලදී. එම සංශෝධන වල අරමුණ වන්නේ, නිවාස අවශ්‍යතාවයක් වෙනුවෙන් හෝ සෞඛ්‍ය ප්‍රතිකාර සඳහා සේවක ගිණුමේ ශේෂයෙන් 30% ක් ආපසු ගෙවීමයි.

සේවක අර්ථසාධක අරමුදල් අංශයේ 2010 ජනවාරි සිට 2010 දෙසැම්බර් දක්වා ප්‍රගතිය

| | |
|---|---|
| **ප්‍රතිලාභ ගෙවීම** | |
| • ප්‍රතිලාභීන් ගණන | 104262 |
| • ගෙවූ ප්‍රතිලාභ මුදල | රු. (මිලියන) 34,896 |
| **සේ.අ.අ. දායක මුදල් හා අධිභාර මුදල් අයකර ගැනීම** | රු. (මිලියන) 258 |
| **සේ.අ.අ. නිවාස ණය ගෙවීම** | |
| • අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 13848 |
| • අනුමත කළ ණය මුදල | රු. (මිලියන) 4,512 |
| **නව සේවා යෝජකයන් ලියාපදිංචි කිරීම** | 5338 |
| **සේ.අ.අ. සාමාජික වාර්තා පරිගණක ගත කිරීම** | |
| • දත්ත පරිගණක ගත කිරීම (ඒ සහ එච්) | 345813 |
| • ස්කෑන් කිරීම ( ඒ සහ එච්) | 1,041,006 |


**සේ.අ.අ. සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියෙ හි සේවකයන්ගේ ඇඟිලි සළකුණු ලබා ගැනීමේ ව්‍යාපෘතිය**

සේ.අ.අ සාමාජිකයන්ට ඒකීය අංකන ක්‍රමයක් ලබාදීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ. සේවකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂය අවසාන වන විට සේවකයන් 702,702 ගේද, ඇඟලි සළකුණු ලබා ගැනීමේ ව්‍යාපෘතිය යටතේ සේවකයන් 415,850 ගේද කටයුතු නිම කරන ලදී.

# කාර්මාන්තමය සුරක්ෂිතතා අංශය

10

කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම් සහ සිදු කරන ලද පරීක්ෂණ වල ප්‍රගතිය 2000 - 2010




| | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා ප්‍රමාණය | 9390 | 11113 | 12324 | 13879 | 14384 | 15253 | 16057 | 17002 | 18247 | 20053 |
| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 3151 | 4420 | 4123 | 3670 | 4089 | 3916 | 3507 | 4344 | 4636 | 4482 |

**කර්මාන්තශාලා වල සේවකයින්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය, සුබ සාධනය තහවුරු කරනු වස් 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත ක්‍රියාවෙහි යෙදවීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. කොළඹ, ගම්පහ, කුරුණෑගල, මහනුවර, ගාල්ල, යාපනය, අනුරාධපුර, රත්නපුර, බදුල්ල හා කළුතර යන නගර වල පිහිටි දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් මඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම අංශය කටයුතු සිදු කරනු ලබයි.**

## ජාතික සුරක්ෂිතතා සම්මාන

මෙම සම්මාන ප්‍රදානය දෙවසරකට වරක් පවත්වනු ලබන අතර, කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ ඉංජිනේරු මඬුල්ලක් විසින් සම්මානලාභීන් තෝරාගනු ලබයි. මෙය මහා පරිමාණ මධ්‍ය, පරිමාණ හා කුඩා පරිමාණ වශයෙන් අංශ 3 ක් යටතේ පවත්වනු ලබන අතර, ජාතික සුරක්ෂිතතා සම්මාන හා කර්මාන්තමය සුරක්ෂිතතා සම්මාන වශයෙන් දෙයාකාරයක සම්මාන ප්‍රදානය කරනු ලබයි.

## ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ සතිය

සෑම වසරකම ඔක්තෝම්බර් මස දෙවන සතියේදී ජාතික වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ සතිය පවත්වනු ලබයි. 2010 වසරේ දී මෙම සතිය වෙනුවෙන් අංශයේ ඉංජිනේරුවරුන් විසින් ආයෝජන ප්‍රවර්ධන කලාපයන් හා රටපුරා විසිරී ඇති වෙනත් විධිමත් හා අවිධිමත් අංශයන් තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. 2010 ඔක්තෝම්බර් මස 15 වන දින කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ විශේෂ වැඩමුළුවක් ද පැවැත්වීමට කටයුතු කරන ලදී.

## කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

### දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාලවල 2010 වසරේ කාර්යසාධනය

| | අනුරාධපුර | ගම්පහ | කොළඹ | මහනුවර | ගාල්ල | රත්නපුර | යාපනය | කළුතර | කුරුණෑගල | බදුල්ල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා | 1099 | 3005 | 3651 | 1869 | 3270 | 1255 | 2399 | 1152 | 1749 | 604 | 20053 |
| කර්මාන්තශාලා හා වෙනත් පරීක්ෂණ | 217 | 533 | 1355 | 419 | 168 | 217 | 457 | 174 | 626 | 316 | 4482 |
| මාරාන්තික අනතුරු | 06 | 06 | 15 | 09 | 14 | 02 | 01 | 03 | 03 | 05 | 64 |
| මාරාන්තික නොවන අනතුරු | 20 | 433 | 436 | 109 | 86 | 73 | 09 | 155 | 81 | 54 | 1456 |
| වාෂ්ප/හුමාල බොයිලේරු පරීක්ෂා | 87 | 187 | 289 | 103 | 40 | 24 | - | 66 | 171 | 32 | 999 |
| වාෂ්ප/හුමාල ග්‍රාහක පරීක්ෂණ | 19 | 165 | 148 | 43 | 17 | 05 | - | 77 | 86 | 23 | 583 |
| වාත ග්‍රාහක පරීක්ෂණ | 54 | 426 | 402 | 377 | 261 | 172 | - | 181 | 325 | 66 | 2264 |
| වායු ග්‍රාහක පරීක්ෂණ | - | - | 84 | - | 03 | - | - | 29 | - | 09 | 125 |
| අතිකුත් අධිඅන්තරාදාය යන්ත්‍ර පරීක්ෂාව | 12 | 325 | 364 | 485 | 60 | 127 | - | 33 | 254 | 47 | 1707 |
| පිඹුරුපත් අනුමැතිය | 01 | 55 | 28 | 04 | 01 | - | 04 | 11 | - | - | 104 |
| දේශන සහ සම්මන්ත්‍රණ | 04 | 60 | 33 | 23 | 06 | - | 35 | 29 | 08 | 67 | 265 |
| උසාවිගත කරන ලද නඩු | - | - | 04 | 08 | 01 | - | - | - | 16 | - | 29 |

# වෘත්තීය ස්වස්ථතා අංශය

11

<u>පාරිසරික මිනුම්</u>

සේවා ස්ථානවල පරිසරයේ ඇති භෞතික හා රසායනික ආපදා නිර්ණය කිරීම සඳහා මෙම අංශයේ ඇති සූක්ෂම මිනුම් උපකරණ භාවිතා කරනු ලබයි.

<u>පෙනහළු ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂණ</u>

විශේෂයෙන් ඇස්බැස්ටස් හා සිමෙන්ති කර්මාන්තය, රෙදි විවීමේ කර්මාන්තය, බහුල ලෙස රසායනික ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නිරත සේවකයන් සම්බන්ධව මෙම පරීක්ෂාවන් වාර්ෂිකව සිදුකරනු ලබයි. 2010 වර්ෂය තුල පෙනහළු ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂාවන් 170 ක් පවත්වා ඇත.

<u>ශ්‍රවණ පරීක්‍ෂණ</u>

සේවා ස්ථානය තුළ දැඩි ඝෝෂාකාරී තත්වයන්ට නිතර මුහුණ දෙන සේවකයන් වෙනුවෙන් ශ්‍රවණ පරීක්‍ෂණ මෙම අංශය මඟින් සිදුකරනු ලබයි. 2010 වර්ෂය තුළ පරීක්‍ෂණ 230ක් සිදුකරන ලදී.

<u>සේ.අ.අ. වෛද්‍ය මණ්ඩලය</u>

සේවකඅර්ථ සාධක අරමුදල සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවේ වෛද්‍ය මණ්ඩලයේ සභාපතිධූරය වෘත්තීය ස්වස්ථතා අංශයේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් විසින් දරනු ලබයි.

සේවය කිරීමට නොහැකි පරිදි රෝගාබාධ හෝ අනතුරු ඇතිවීම හේතුවෙන් විශ්‍රාම වයස සම්පූර්ණ වීමට පෙර, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම සඳහා අනුමැතිය ලබා දෙනු ලබන්නේ මෙම මණ්ඩලය මඟිනි. 2010 වසර තුළ වෛද්‍ය මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලද අතර 600 කට අධික සේවක සංඛ්‍යාවක් පරීක්‍ෂාවට ලක් කරන ලදී.

<u>සේවක වන්දි තක්සේරුකරණය</u>

මෙම අංශය මගින් සිදු කරනු ලබන වැදගත් කාර්යයක් වනුයේ වෘත්තීයමය රෝගාබාධ හා අනතුරු සම්බන්ධයෙන් සේවකයන්ට ගෙවිය යුතුවන සේවක වන්දි ප්‍රමාණය තක්සේරු කිරීමයි. 2010 වසර තුළ සේවකයන් 55 දෙනෙකු පරීක්‍ෂාවට ලක් කරන ලදී.

<u>පුහුණුව හා අධ්‍යාපනය</u>

2010 වර්ෂය තුළ විවිධ ආයතන මට්ටමින් කළමනාකරණ මට්ටමේ නිලධාරීන් වෙනුවෙන් පැවති පුහුණු වැඩසටහන් 25ක් සුපරීක්‍ෂණ මට්ටමේ අය වෙනුවෙන් පැවති පුහුණු වැඩසටහන් 35 ක් හා අනෙකුත් සේවකයන් වෙනුවෙන් පැවති වැඩසටහන් 40 ක් වෙනුවෙන් මෙම අංශයේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් හා පරීක්‍ෂණ නිලධාරී විසින් සම්පත් දායකයන් ලෙස තම දායකත්වය ලබා දී ඇත.

**වෘ**ත්තීයමය ආපදා, වෘත්තීයමය රෝගාබාධ හා සේවා ස්ථානවල කටයුතු ආශ්‍රිතව ඇතිවන අයහපත් සෞඛ්‍ය තත්වයන් අවම කිරීම මෙම අංශයේ අරමුණ වේ.

අනතුරු හා උපද්‍රව වලින් තොර මෙන්ම වෘත්තීයමය සෞඛ්‍ය මනාව සුරැකෙන සේවා පරිසරයක්, සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ යාමට මෙන්ම, නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ වල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට හේතුවන බව නොරහසකි. කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය නෛතික අවශ්‍යතාවයක් වේ. ඉහත පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා වෘත්තීය ස්වස්ථතා අංශය මඟින් වැදගත් ක්‍රියාකාරකම් සමූහයක් සිදුකරනු ලබයි.

# 12 සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය

## සැලසුම් හා පර්යේෂණ

දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා විධිමත් මඟ පෙන්වීමක් ලබාදෙන පරිදි මනා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමත්, එම ක්‍රියාකාරකම්වල කාර්තුමය ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමත් සිදු කරනු ලබන අතර, එමගින් දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලට තම කාර්යභාරය පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගත හැකි වේ. එමෙන්ම සැලසුම් කළ තත්ත්වයෙන් විචලනයක් සිදු වන විට නැවතත් ඉලක්කගත කාර්යසාධනය වෙත ළඟාවීමට මඟපෙන්වීමද මේ මඟින් සිදු වේ.

## ප්‍රගති සමාලෝචන

දිවයින පුරා කම්කරු නිලධාරීන් විසින් සිදුකරනු ලබන කම්කරු පරීක්ෂණවල ගුණාත්මකභාවය සොයා බැලීම සඳහා සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් කම්කරු නිලධාරීන්ගේ මාසික දිනපොත් පරීක්ෂා කරනු ලබන අතර, ඒ අනුව පරීක්ෂණ ක්‍රියාවලිය තුළ හඳුනා ගන්නා ගැටලු නිවැරදි කරගැනීමට මඟපෙන්වීම සිදු කරනු ලබයි. එමෙන්ම දිවයිනේ විවිධ කළාප මට්ටමින් පවත්වනු ලබන ප්‍රගති මෙහෙයුම් සැසිවල සම්බන්ධීකරණය ද සිදු කරනු ලබයි.

## ප්‍රකාශන

දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් වෙනුවෙන් පහත සඳහන් කම්කරු අණ පනත් මුද්‍රණය කිරීම මෙම අංශය විසින් සිදුකරනු ලබයි.

01. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත
02. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
03. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත
04. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
05. 1939 අංක 32 දරන ප්‍රතිසූතිකාධාර ආඥා පනත
06. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
07. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත
08. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

**දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස කුසලතා පිරිපුන් නිලධාරීන් පිරිසක් බිහිකිරීම, කාර්මික සාමය ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සැලසුම් සකස් කිරීම හා ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, දත්ත රැස්කිරීම හා පර්යේෂණ පැවැත්වීම සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ මෙහෙවර වේ. මෙහිදී, ප්‍රධාන ක්ෂේත්‍රයන් 04 ක් යටතේ අංශය විසින් සිය කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.**

01. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු කටයුතු
02. සැලසුම් හා පර්යේෂණ
03. ප්‍රගති සමාලෝචන
04. ප්‍රකාශන කටයුතු

<u>දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු කටයුතු</u>

2010 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විවිධ මට්ටම් වල නිලධාරීන් වෙනුවෙන් පැවැත්වූ පුහුණු කටයුතු පහත පරිදි වේ.

| වැඩසටහන / විශයය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|
| නවක සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ පුහුණු වැඩසටහන | 1 | 30 |
| නවක කම්කරු නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් | 5 | 263 |
| කම්කරු නිලධාරී පුහුණු වැඩසටහන් (ප්‍රදේශිය) | 2 | 110 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 33 | 1049 |
| වෙනත් පුහුණු වැඩසටහන් | 2 | 115 |

මීට අමතරව පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් 8 දෙනෙකුට අවස්ථාව සලසා දෙනු ලැබීය. එමෙන්ම, වෙනත් බාහිර ආයතන වල පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 29 දෙනෙකු යොමු කරන ලදී.

# 13 සංඛ්‍යාලේඛන අංශය

## වාර්ෂික රැකීරක්‍ෂා සමීක්ෂණය

දිවයිනේ පරිපාලනය සහ ක්‍රමසම්පාදන අවශ්‍යතා සඳහා ඉවහල් වන සංඛ්‍යාන දත්ත එක් රැස් කිරීම මෙම සමීක්‍ෂණයේ ප්‍රධාන අරමුණුයි. වැටුප් ලබන සේවකයින් 5 දෙනෙකු හෝ ඊට වඩා වැඩි සේවා නියුක්තියක් ඇති පෞද්ගලික අංශයේ ආයතන සහ අර්ධ රාජ්‍ය අංශයේ නිෂ්පාදනය, බෙදාහැරීමේ ව්‍යාපාර සහ වාණිජ කටයුතු වල නියුතු ආයතන වලින් සෑම වසරකම ජූනි මාසයට අදාළව රැකියා නියුක්තිය පිළිබඳව තොරතුරු මෙම සමීක්‍ෂණය මඟින් රැස්කරනු ලැබේ. තොරතුරු පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාකාරී වන ආයතන පිළිබඳ විස්තර විශේෂ කොටසක් ලෙස මෙම වාර්තාවට ඇතුළත් කරන ලදී. 2009 වර්ෂයේ රැකීරක්‍ෂා සමීක්‍ෂණ වාර්තාව සකස් කර අවසන් වී ඇති අතර මුද්‍රණ කටයුතු සඳහා සූදානම් කෙරෙමින් පවතී.

## කම්කරු සංඛ්‍යාති - 2009 ප්‍රකාශනය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම

කම්කරු ක්ෂේත්‍රයට අදාල කාලීන හා විශ්වසනීය තොරතුරු ඇතුළත් කම්කරු සංඛ්‍යාති - 2009 වාර්ෂික ප්‍රකාශනය අදාල කාලය තුළ මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී.

## සාමාන්‍ය පෙඩයීම් හා වැඩකළ පැය ගණන පිළිබඳ සමීක්ෂණය

අර්ධ වාර්ෂිකව පවත්වනු ලබන මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු වනුයේ, පඩි පාලක සභා මඟින් අවම වැටුප් නියම කර ඇති කර්මාන්ත ආයතන වල වැඩ කරන සේවකයින්ගේ මාසික සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කරන පැය ගණන් පිළිබඳ තොරතුරු රැස්කිරීමයි.

නියැඳි පදනමක් මත තෝරාගත් ආයතන වලට තැපැල් මාර්ගිකව යවනු ලබන ප්‍රශ්නාවලියක් මගින් සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාස වල දී මෙම සමීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණය මගින් ලබා ගන්නා තොරතුරු ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ජිනීවා හි ජාත්‍යන්තර කම්කරු කාර්යාල වැනි ජාතික හා අන්තර් ජාතික ආයතනවලට ද යවනු ලැබේ. අදාල කාලය තුළදී 2009 මාර්තු හා සැප්තැම්බර් මාස වල පවත්වන ලද සමීක්ෂණ දෙකෙහි සම්පින්ඩන වාර්තාව සකස් කර අවසන් කරන ලදි.

**ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ සංවිධානය වූ අංශයට අදල දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම සංඛ්‍යාලේඛන අංශයේ ප්‍රධාන කාර්යය වේ. මේ සඳහා වාර්ෂිකව තැපැල් මාර්ගිකව පවත්වනු ලබන ප්‍රධාන සමීක්‍ෂණ දෙකකින් පැය ගණන පිළිබඳව දත්ත එක්රැස් කරනු ලැබේ. ඒ සමඟ විවිධ පරිපාලන දත්ත වක්‍ර ගත කිරීම, අවම වැටුප් දර්ශකාංකය සකස් කිරීම මෙම අංශයෙන් ඉටු කරන අනෙකුත් කාර්යයන් වේ.**

**අංශය අනුව සාමාන්‍ය දෛනික ඉපැයීම 1999-2009 (රු.)**

| අංශය / වර්ෂය | කෘෂිකර්මාන්තය (වැවිලි අංශය) (රු.) | නිෂ්පාදන අංශය (රු.) | ඉදිකිරීම් අංශය (රු.) |
|---|---|---|---|
| 1999 | 96.89 | 199.20 | 241.11 |
| 2000 | 104.12 | 221.11 | 285.99 |
| 2001 | 112.11 | 230.66 | 263.12 |
| 2002 | 128.72 | 273.10 | 259.63 |
| 2003 | 138.43 | 306.84 | 276.42 |
| 2004 | 152.94 | 310.84 | 335.70 |
| 2005 | 178.47 | 336.49 | 416.75 |
| 2006 | 206.33 | 356.11 | 424.55 |
| 2007 | 198.01 | 411.60 | 408.37 |
| 2008 | 298.85 | 469.47 | 443.91 |
| 2009 | 323.20 | 492.93 | 472.58 |

<u>අවම වැටුප් දර්ශකාංකය 2000 - 2010 (පදනම 1978 = 100)</u>

පඩිපාලක සභා යටතේ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලබන අවම වේතන හා ඒවායේ කාලීන සංශෝධන පදනම් කරගෙන මාසිකව හා වාර්ෂිකව මෙම දර්ශකාංකය ගණනය කරනු ලැබේ.

අවම වැටුප් දර්ශකාංකය 2000 - 2010

| වර්ෂය | කෘෂිකර්මය (වැවිලි අංශය) | වාණිජ සහ කර්මාන්ත අංශය | සේවා අංශය | සියළු අංශ සඳහා |
|---|---|---|---|---|
| 2000 | 1,142.7 | 857.1 | 559.7 | 1,000.4 |
| 2001 | 1,176.4 | 919.7 | 657.6 | 1,049.2 |
| 2002 | 1,269.6 | 986.5 | 678.0 | 1,126.5 |
| 2003 | 1,382.3 | 1,009.4 | 678.0 | 1,205.3 |
| 2004 | 1,397.7 | 1,044.1 | 751.0 | 1,233.1 |
| 2005 | 1,527.4 | 1,078.4 | 779.7 | 1,329.7 |
| 2006 | 1,567.1 | 1,090.6 | 779.7 | 1,358.2 |
| 2007 | 1,821.4 | 1,522.4 | 157.0 | 1,648.7 |
| 2008 | 2,286.6 | 1,877.5 | 1,370.8 | 2,070.4 |
| 2009 | 2,349.4 | 2,053.9 | 1,545.8 | 2,171.4 |
| 2010 | 3,328.0 | 2,199.0 | 1,673.3 | 2,865.3 |

14

# මුදල් අංශය

2010 වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු.769,571,000/- ක මුදලක් වෙන්වූ අතර එයින් රු. 760,752,134/- ක් වැය කරන ලදී. එමෙන්ම ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්වූ රු.222,000,000/- ක මුදලින් රු 218,993,557/- ක මුදලක් වැය කරන ලදී මේ අනුව ප්‍රාග්ධන වියදම් සම්බන්ධව 98.6% ක හා පුනරාවර්තන වියදම් සම්බන්ධව 98.8% ක ප්‍රගතියක් ලගා කර ගන්නා ලදී.

| විස්තරය | | 01 මෙහෙයුම් වැඩසටහන | 02 සංවර්ධන වැඩසටහන | | |
|---|---|---|---|---|---|
| | | 1-1 | 2-2 | 2-3 | 2-4 |
| පුනරාවර්තන | ප්‍රතිපාදන | 414,623,000 | 54,093,000 | 42,862,000 | 257,993,000 |
| | වියදම | 411,304,216 | 52,308,827 | 42,054,231 | 255,084,860 |
| ප්‍රාග්ධන | ප්‍රතිපාදන | 66,700,000 | 5,900,000 | 1,150,000 | 148,250,000 |
| | වියදම | 66,315,647 | 5,107,407 | 994,742 | 146,575,761 |

# අභ්‍යන්තර විගණන අංශය

2010 වර්ෂයේ යෝජිත ක්‍රියාකාරී වැඩ සැලැස්ම අනුව ප්‍රගති සමාලෝචන කටයුතු පිළිබඳ පරීක්ෂණ ඇතුළු දෙපාර්තමේන්තුවට අයත් විවිධ අංශයන් 40 ක් පරීක්ෂා කිරීමට නියමිත විය. ඉන් කාර්යාල 25 ක් පරීක්ෂා කර ඒ ඒ අංශයන් වල සිදු වී ඇති දුර්වලතා හඳුනා ගෙන නිවැරදි කර ගැනීම සඳහා වන යෝජනාවන්ද ඇතුලත් වන අභ්‍යන්තර විගණන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇත. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා යෝජිත කර්යාල 40 න් පරීක්ෂා කිරීමට හැකි වූයේ 25 ක් පමණි.

**මෙදෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා මුදල් රෙගුලාසි වලට අනුකූල වෙමින්, මනා මූල්‍ය පරිපාලනයක් ඇති කිරීම තම අරමුණ කරගත් මෙම අංශය වාර්ෂික ඇස්තමේන්තු වලින් වෙන් කරනු ලබන මුදල් විධිමත්ව හා කාර්යක්ෂමව වැය කිරිමත්, ඒ ඒ කාර්යාල හා අංශ වල අවශ්‍යතාවයන් පරිදි එක් එක් ව්‍යාපෘති වලට අවශ්‍ය මුදල් වෙන් කරමින් කාලානුරූපීව අදාල වියදම් දරමින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරා ගැනීමත් සිදු කරනු ලබයි.**

**අභ්‍යන්තර විගණන අංශය**

**අභ්‍යන්තර පාලන පද්ධතීන් සැලසුම් කරන ලද ආකාරයට ස්වාධීන තහවුරුවක් ලැබෙන පරිදි ද රාජ්‍ය ගිණුම්කටයුතුභාවය සුරකෙන පරිදි ද දෙපාර්තමේන්තුවේ කටයුතු සිදුවන බවට කළමනාකරණ විගණනයක් තුළින් තහවුරු කිරිම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.**

15

# පාලන අංශය

පාලන අංශයේ වගකීම ඵලදායී අන්දමින් ඉටුකරමින් 2010 වසරේදී කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කරන

| කාර්යාලය | වැය කළ මුදල |
|---|---|
| **මොණරාගල ලේඛනාගාරය හා ගබඩාව ඉදිකිරීම - II අදියර** | **1,740,900.00** |
| **කන්තලේ කාර්යාලය ඉදිකිරීම - I අදියර** | **758,400.00** |
| **හපුතලේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම - III අදියර** | **2,604,825.00** |
| **හපුතලේ කාර්යාලයේ පඩිපෙලෙහි අත්වැට සැකසීම** | **232,900.00** |
| **කළුතර කාර්යාලය ඉදිකිරීම - II අදියර** | **4,693,700.00** |
| **කළුතර කාර්යාලය ඉදිකිරීම - III අදියර** | **1,724,000.00** |
| **අනුරාධපුර කලාප කම්කරු කාර්යාලය ඉදිකිරීම** | **759,570.00** |
| අනුරාධපුර ස.කම්.කො. කාර්යාලය අළුත්වැඩි කිරීම - II අදියර | 2,590,530.00 |
| අම්පාර කාර්යාලය ඉදිකිරීම - II අදියර | 968,400.00 |
| මඩකලපුව කාර්යාලය ඉදිකිරීම - II අදියර | 4,393,900.00 |
| කුලියාපිටිය කාර්යාලය ඉදිකිරීම - II අදියර | 806,100.00 |
| මොණරාගල ගබඩා සංකීර්ණයේ උඩුමහලට ග්‍රිල් ගේට්ටුවක් සවිකිරීම | 92,475.00 |
| මඩකලපුව කාර්යාලය ඉදිකිරීම - I අදියර | 7,924,900.00 |
| දිස්ත්‍රික් කාර්යාල වල සුළු ඉදිකිරීමේ කටයුතු | 278,780.00 |

**කම්කරු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යභාරය සකස් කිරීම හා වර්ධනය කිරීම සහ භෞතික සම්පත් සහ මානව සම්පත් වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මෙම අංශයෙහි වගකීමයි.**

**මෙම අංශය යටතේ අනු අංශ 04 ක් ක්‍රියාත්මක වේ.**

- **පාලන ශාඛාව**
- **ආයතන ශාඛාව**
- **ගොඩනැගිලි නඩත්තු ඒකකය**
- **පුස්තකාලය හා තොරතුරු සේවය**

අපේක්ෂිත පරිදි අදාළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකි විය එයට හේතු වූයේ වර්ෂය අවසානයේදී ඇති වූ අධික වර්ෂා තත්වයත්, කොන්ත්‍රාත්කරුවන් වැඩ පැහැර හැරීමත් හේතුවෙනි. රුපියල් මිලියන 5 ක මුදලක් යාපනය කම්කරු කාර්යාල සංකීර්ණය ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කරන ලදී. එසේම ඉතිරි වූ රුපියල් 16,630,620.00 ක මුදල 2011 වර්ෂයේ භාවිතා කිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කරන ලදී.

පාලන අංශය

නඩත්තු කටයුතු වෙනුවෙන් වැයකල මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| ප්‍රධාන කාර්යාලය | වැය කල මුදල |
|---|---|
| බිම් මහලේ කොටසක් පින්තාරු කිරිම, | |
| විදුලි සෝපානය (VIP) අසල ටයිල් ඇතිරීම | 55,500.00 |
| 10 වන මහල ක්‍රීඩාංගණයේ තීන්ත ආලේප කිරීම | 73,400.00 |
| කම්කරු මහලේකම් කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු | 240,600.00 |
| බෙලිඅත්ත ඉඩම වටා වැට ගැසීම | 293,700.00 |
| අවිස්සාවේල්ල වැසිකිලි අළුත්වැඩියාව | 315,900.00 |
| මාතර ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | 260,700.00 |
| කල්මුණේ කාර්යාලයේ බෙදුම් ඇඳි සවිකිරීම | 563,600.00 |
| මුදල් අංශයට පරෙවියන් ඇතුල්වීම වැළැක්වීමට දැල් ගැසීම | 115,000.00 |
| කම්කරු මහලේකම් කාර්යාලය ඉදිරිපස ගරාජය අළුත්වැඩියා කිරීම | 130,500.00 |
| ප්‍රධාන කාර්යාලයේ වහළ අළුත්වැඩියාව | 485,000.00 |
| මුදල් අංශයේ බෙදුම් ඇඳි සවිකිරීම | 347,600.00 |
| දිස්ත්‍රික් කාර්යාල වල අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ | |
| (නඩත්තු අංශයට) | 200,000.00 |
| අනුරාධපුරය කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු | 232,000.00 |
| ජාවත්ත කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු | 503,000.00 |
| දිස්ත්‍රික් කාර්යාල වල සුළු අළුත්වැඩියා කටයුතු | 133,900.00 |

**දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල විස්තර**

| | |
|---|---|
| වර්ෂය ආරම්භයේ සිටි මුළු සේවක සංඛ්‍යාව | 2215 |
| නව බඳවා ගැනීම | 130 |
| ස්ථාන මාරුවී දෙපාර්තමේන්තුව වෙත පැමිණීම් | 24 |
| විශ්‍රාම ගැනීම | (69) |
| දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය සංඛ්‍යාව | (22) |
| වෙනත් ආකාරයකට දෙපාර්තමේන්තුව හැරයාම් | (64) |
| වර්ෂය අවසානයේ සේවක සංඛ්‍යාව | 2214 |

**වර්ෂය තුළ නව බඳවා ගැනීම් හා වර්ෂය තුළ විශ්‍රාම යාම්**

| | නව බඳවා ගැනීම් | විශ්‍රාම යාම් |
|---|---|---|
| කම්කරු කොමසාරිස් | - | 01 |
| සහකාර කම්කරු කොමසාරිස් | - | 08 |
| කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | - | 01 |
| කම්කරු නිලධාරී (සිංහල/දෙමළ මාධ්‍ය) | 100 | 19 |
| ඇඟිලි සටහන් පරීක්ෂක | - | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | - | 29 |
| සේ.අ.අ. ලිපිකරු | - | 01 |
| ලේඛණ භාරකරු | - | 01 |
| ස්ථානභාර නිලධාරී | 04 | - |
| සංචාරක බංගලා භාරකරු | 01 | - |
| කාර්යාල සේවක සේවය | 13 | 06 |
| රියදුරු | - | 02 |
| මුරකරු | 07 | - |
| සනීපාරක්ෂක කම්කරු | 05 | - |

## ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා විදේශ ගතවීම්

| | නම | තනතුර | රට - පාඨමාලාව/සම්මන්ත්‍රණය/වැඩමුළුව | කාලසීමාව |
|---|---|---|---|---|
| 01 | කේ.ජී. යෝගචන්ද්‍ර මයා | ස.කම්.කො. | ඕස්ට්‍රේලියාව - පශ්චාත් උපාධි පාඨමාලාව | 2009.01.12 - 02010.12.19 |
| 02 | කේ.ආර්.එම්.ඩී. ප්‍රනාන්දු මිය | ජ්‍යෙෂ්ඨ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | කොරියාව - සේවක සුරක්ෂිතතා පුහුණු පාඨමාලාව | 2010.06.20 - 2010.07.01 |
| 03 | ඩී.එ්. ප්‍රේමවතී මිය | නි.කම්.කො. | ස්විස්ටර්ලන්තය - ජාත්‍යන්තර කම්කරු සම්මේලනය | 2010.06.02 - 2010.06.18 |
| 04 | එච්.ජී. ජිනදාස මයා | නි.කම්.කො. | ස්විස්ටර්ලන්තය - ජාත්‍යන්තර කම්කරු සම්මේලනය | 2010.06.02 - 2010.06.18 |
| 05 | එස්. අමරතුංග මයා | පර්යේෂණ නිලධාරී | තායිලන්තය - Inter Agency Awareness raising workshop on the Sound Mgt. of Industrial chemicals with special Emphasis on Asbestos for the Asia pacific region | 2010.08.30 - 2010.09.04 |
| 06 | වී.බී.ජී.කේ. වීරසිංහ මිය | අති.කම්.කො.ජ. | ඉන්දුනීසියාව - Study meeting on Innovation in public Sector Service Delivery | 2010.10.31 - 2010.11.06 |
| 07 | වී.බී.ජී.කේ. වීරසිංහ මිය | අති.කම්.කො.ජ. | චීනය - Seminar on Female Capacity Building in China | 2010.03.28 - 2010.04.20 |
| 08 | ආර්.ජේ අබේසිරිවර්ධන මයා | කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | කොරියාව - Fellowship Training on Employment Insurance & Employment Injury Assurance | 2010.10.09 - 2010.10.17 |
| 09 | ඩී.ජී.කේ.ආර්. වීරකෝන් මයා | කම්.කො. | දකුණු අප්‍රිකාව - World Social Security Forum 2010 | 2010.11.27 - 2010.12.06 |
| 10 | ජී.ජී. අබේසිංහ මයා | වි.කර්.පරී. ඉංජිනේරු | ස්විස්ටර්ලන්තය - ජාත්‍යන්තර කම්කරු සම්මේලනය | 2010.05.31 - 2010.06.19 |
| 11 | කේ.ඩී.එම්. ප්‍රියන්ත මයා | නි.කම්.කො. | ඉන්දියාව - Master Degree HR Planning & Development Program | 2009.01.31 - 2010.02.01 |
| 12 | එන්.සී. අමරසිංහ මිය | වෛද්‍ය නිලධාරී | ජපානය - Multi country Observational Study Mission on Mental Health and Productivity | 2010.01.17 - 2010.01.23 |
| 13 | එන්. චන්ද්‍රහසන් මයා | ස.කම්.කො. | වියට්නාමය - Training course on six sigma Green Belt | 2010.05.23 - 2010.05.30 |
| 14 | එස්.එම්.කේ.එම්. ද අල්විස් මිය | ස.කම්.කො. | ඉන්දියාව - Training Programme on Labour and Employment Relations in Global Economy | 2010.11.07 - 2010.11.27 |
| 15 | ජී.ඩබ්.එම්.ඩී. වික්‍රමසිංහ මයා | ස.කම්.කො. | තායිවානය - Study meeting on Business Development Strategies for SMES after the Global Financial Crisis | 2010.11.22 - 2010.11.27 |
| 16 | බී. වසන්තන් මයා | ස.කම්.කො. | කොරියාව - Fellowship Training on Employment Insurance (E1) & Employment Injury Assurance E(11) | 2010.10.09 - 2010.10.17 |

පාලන අංශය